දැන්වීමයි

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

අධි සේවක පදනම මත ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු අධිකාරී තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2024

පරිපාලන අභියාචනා අංක AAT/44/2020 අභියාචනයට අදාළව පරිපාලන විනිශ්චය අධිකාරිය විසින් 2023.08.29 දිනැතිව ලබා දී ඇති නියෝගයට අනුව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ අධි සේවක පදනම මත පත් කිරීම සඳහා 2012.11.11 දින පැවති සුරාබදු අධිකාරී තනතුරට උසස් කිරීම (සීමිත) තරග විභාගයට පෙනී සිට උසස්වීම නොලත් සහ 2020.06.23 දිනට සක්‍රිය සේවයේ නියුතුව සිටි නිලධාරීන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත සම්පූර්ණ කර පහත සඳහන් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල් , ආයතනික විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අධිසේවක පදනම මත සුරාබදු අධිකාරී තනතුරට බඳවා ගැනීම - සීමිත " යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තව ද විභාගයේ නම සිංහල හා දෙමළ ඉල්ලුම් පත්‍රවල ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

(අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2024.12.20 දින වේ.

සටහන : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැක. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

2. සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය

බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි ලිඛිත විභාගය හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වන අතර, ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයන් සඳහා 40%කට වඩා ලබාගනිමින් සමත්වන අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ සහ ලිඛිත විභාගයේ ඒකාබද්ධ ලකුණු 156 ට වඩා ලබා ගන්නා අයදුම්කරුවන් අධිසේවක පදනම මත ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු අධිකාරී තනතුරට බඳවා ගනු ලැබේ.

3. සුදුසුකම්

මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබන්නේ 2012.11.11 දින පැවති සුරාබදු අධිකාරී තනතුරට උසස් කිරීම (සීමිත) තරග විභාගයට පෙනී සිට උසස්වීම නොලත් නිලධාරීන් පමණි.

සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනය වන්නේ 2012.11.11 දින පැවති සුරාබදු අධිකාරී තනතුරට උසස් කිරීම (සීමිත) තරග විභාගයට අයදුම්පත් කැඳවන ලද අවසාන දිනය වූ 2012.08.02 දිනට වේ.

3.1 පළපුරුද්ද හා අනෙකුත් සුදුසුකම්

2012.07.05 දින ප්‍රසිද්ධ කරන ලද "ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු අධිකාරී තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය -2010 (2012)" අයදුම්පත් කැඳවීමේ නිවේදනයට සහ ඊට අදාළව සිදු කර ඇති සියලු සංශෝධනයන්ට අනුව සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතුය. (2012.07.05 දින ප්‍රසිද්ධ කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනය මේ සමඟ ඉදිරිපත් කර ඇත.)

4. වයස් සීමාව

අදාළ නොවේ.

5. වැටුප් පරිමාණය

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය රු. 47,615 – 10X 1,335 - 8X1,630 - 17X2,170 – 110,895 (SL-1-2016) වේ.

6. ලිඛිත විභාගය/ සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි/ කාර්යක්ෂමතා කඩඉම් විභාගය / සේවා කොන්දේසි සහ ලකුණු පරිපාටිය

2012.07.05 දින ප්‍රසිද්ධ කරන ලද "ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු අධිකාරි තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2010 (2012)" අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙහි අනු අංක 06 හි සිට 10 දක්වා සඳහන් කර ඇති පරිදි සහ එම අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළව සිදු කර ඇති සියලු සංශෝධනයන් ද ඊට අදාළ වේ.

7. විභාග කොන්දේසි

i. විභාගය සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර සියල්ලටම පෙනී සිටිය යුතුය.

ii. විභාග ගාස්තුව රු.1200/- කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

iii. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ. විභාග ගාස්තු වශයෙන් මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

iv. මෙම විභාගය ........................ මස කොළඹදී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

v. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන : ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

vi. ඉල්ලුම් පත්‍රය සෙ.මී.22-29 ප්‍රමාණයේ A 4 කඩදාසිවල සකස් කළ යුතු අතර, 01-04 තෙක් ශීර්ෂ පළමුවන පිටුවෙහි අඩංගු වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර හා අසම්පූර්ණ ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාල ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අවසානයට ඇති ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි.

vii. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත්, තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කර ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ ලියාපදිංචි කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

viii. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

ix. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

x. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

xi. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එම නීතිය පිළිපැදීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

සැලකිය යුතුය : අ. අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

ආ. ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවකදී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට

අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

xii. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානී මඟින් සහතික කර යොමු කළ යුතු වේ.

**8.** සාවද්‍ය තොරතුරු සැපයීම :-

ඔබ විසින් එවන ලද අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

- ❖ මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කරුණක් සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබනු ඇත.
- ❖ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩී.එච්.එස්. පුල්ලපෙරුම
අතිරේක ලේකම්
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන,
සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය

.....................................................
ලේකම්
මුදල් , ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් හා සංචාරක අමාත්‍යාංශය
2024 ඔක්තෝබර් මස 19 දින

**ආදර්ශ අයදුම්පත්‍රය**

**අධි සේවක පදනම මත ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු අධිකාරී තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2024**

# Limited Competitive Examination for recruitment to the posts of Excise Superintendent in the Sri Lanka Excise Department on the basis of Super Numary - 2024

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

(අයදුම් කරන මාධ්‍යයට අදාල අංකය කොටුව තුළ ලියන්න. සිංහල 2/ දෙමළ 3 ☐

සටහන :- අයදුම් කරන මාධ්‍ය පසුව වෙනස් කළ නොහැක

---

1.0 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : ..............................................................................

(සිංහලෙන්/දෙමළෙන්) ..............................................................................

1.2 සම්පූර්ණ නම : ..............................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..............................................................................

1.3 මුලකුරු සමඟ නම (මයා/මිය/මෙය) : ..............................................................................

(සිංහලෙන් / දෙමළෙන්) උදා :- එම්.ජී.බී.එස්.කේ.ගුණවර්ධන

1.4 මුලකුරු සමඟ නම : ..............................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2.0 2.1 ස්ථිර ලිපිනය ; ..............................................................................

(සිංහලෙන් / දෙමළෙන්) ..............................................................................

2.2 ස්ථිර ලිපිනය : ..............................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී /පුරුෂ භාවය: පුරුෂ 0 ස්ත්‍රී 01 ☐ (අංකය කොටුව තුළ ලියන්න)

3.2 විවාහක / අවිවාහක බව : විවාහක - 1 අවිවාහක - 2 ☐ (අංකය කොටුව තුළ ලියන්න)

3.3 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

4.0 දුරකථන අංකය : (ස්ථාවර) ☐☐☐☐☐☐☐☐☐☐

දුරකථන අංකය : (ජංගම) ☐☐☐☐☐☐☐☐☐☐

5.0 5.1 2012.08.02 දිනට දැරූ තනතුර ; ..........................................................................................................

5.2 වර්තමාන තනතුර : ..............................................................................................

5.3 සුරාබදු පරීක්ෂක තනතුරට පත් වූ දිනය : ..................................................................................

5.4 සුරාබදු පරීක්ෂක තනතුරේ ස්ථිර කරන ලද දිනය : ...........................................................................

5.5 සුරාබදු පරීක්ෂක තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වූ දිනය :....................

..................................................

5.6 ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරට පත් වූ දිනය : ..........................................................................

5.7 ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරේ ස්ථිර කරන ලද දිනය : ........................................................

5.8 ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වූ දිනය :-

..................................................................................

5.9 පූර්වාසන්න වසර 05 තුළ (2012.08.02 දිනට) වැටුප් වර්ධක උපයාගෙන තිබේද යන්න :

...................................................................

6. වර්තමාන සේවා ස්ථානය : ..........................................................................................................

7. ළඟා කරගෙන ඇති අධ්‍යාපන සුදුසුකම් : ........................................................................................

..........................................................................................................................................

8. ළඟා කරගෙන ඇති විශිෂ්ට ක්‍රියා : ...........................................................................................

.....................................................................................................................................................

9. ඔබ කවරදාක හෝ කිසියම් චෝදනාවකට ලක්ව උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද යන්න හෝ විනයානුකූල කටයුතුවලට භාජනය වී තිබේද යන්න ? (ඔව් නම් විස්තර කරන්න)

..........................................................................................................................................

10. 0 විභාග ගාස්තු ;

10.1 ගෙවූ මුදල : .......................................................

10.2 ගෙවූ කාර්යාලය : ..............................................

10.3 ලදුපත් අංකය : ..................................................

10.04

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න<br>(ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වේ) |

11. අයදුම්කරුගේ සහතිකය :-

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව මා දන්නා බවත්, සියලු නීති රීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

........................................ ........................................................

දිනය අයදුම්කරුගේ අත්සන

12. සුරාබදු කොමසාරිස් / නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්/සහකාර සුරාබදු කොමසාරිස්ගේ නිර්දේශය:

ඉහත විස්තර සඳහන් ................................................................ මහතා / මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්ඔහුට/ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කල හැකි බවත් සහතික කරමි.

........................................................................

සුරාබදු කොමසාරිස් / නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්/සහකාර සුරාබදු කොමසාරිස්

නම :-

පදවි නාමය :-

ලිපිනය :-

දිනය :-

(නිල මුද්‍රාව යොදන්න)

# " රාජ්‍ය සේවා කොමිෂන් සභාව"

සුරාබදු කොමසාරිස් ජනරාල් මගින්,

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ,

සහකාර සුරාබදු කොමසාරිස්වරුන් / සුරාබදු අධිකාරිවරුන් / සුරාබදු ස්ථානාධිපතිවරුන් වෙත

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු අධිකාරී තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2010 (2012)**

**Limited Competitive Examination for Recruitment of Excise Superintendent to the Sri Lanka Excise Department -2010 (2012)**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු අධිකාරී තනතුරුවල පවත්නා පුරප්පාඩුවලින් සීමිත තරග විභාගයක් මගින් බඳවා ගැනීමට අදාළව, පුරප්පාඩු පිරවීම පිණිස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි පහත සුදුසුකම් ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ අනුව සීමිත තරග විභාගයෙන් පුරවනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව 11 කි.

02 ඒ සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන නිලධාරීන් මේ සමග අමුණා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව අයදුම්පත් පිළියෙල කොට 2012.08.02 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත දක්වා ඇති ලිපිනයට එවිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "සුරාබදු අධිකාරී තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය -2010 (2012) " යන්න සටහන් කල යුතුය.

සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක 34, ඩබ්.ඒ.ඩී.රාමනායක මාවත
කොළඹ 02

03 මාසික වැටුප් පරිමාණය:රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි විධිවිධානයන්ට අනුව SL- 1/2006 වැටුප් පරිමාණය එනම් රු. 22935 – 10 x 645 – 8 x 790 – 17 x1050 – 53555/-( මාසික), මෙම තනතුරට හිමිවන අතර එහි පළමු වන පියවර මෙම තනතුරේ ආරම්භක වැටුප් පියවර වේ.

04 අයදුම්කරුවන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට හෝ ඊට පෙර පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. ( සුදුසුකම් පරීක්ෂා කරනුයේ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනටය )

**4.1 <u>වයස් සීමාව</u>**

ඉල්ලුම්කරුවන් දැනටමත් දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් බැවින් වයස් සීමාවකින් තොරව ඉල්ලුම් කළ හැක.

**4.2 <u>අධ්‍යාපන / වෙනත් සුදුසුකම්</u>**

(අ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සුරාබදු පරීක්ෂක වරයෙක් වශයෙන් සිය තනතුරෙහි ස්ථිර කර ඇති වසර 10 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

(ආ) අදාළ තනතුරේ සියලුම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලින් සමත් වී තිබීම

(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර පූර්වාසන්න වසර 05 තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

(ඈ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර පූර්වාසන්න පස් (05) වසර තුළ ( අවවාද කිරීමක් හැර ) විනයානුකූලව දඬුවමකට භාජනය වී නොතිබීම.

(ඉ) සුරබදු අධිකාරී තනතුරක රාජකාරී කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සුදුසු අවශ්‍ය යහපත් ඇස් පෙනුමකින් හා කාය ශක්තියකින් යුක්තවිය යුතුය.

(ඊ) වෘත්තීය දැනුම හා කුසලතාවන් - සුරාබදු දෙපාර්තමේන්තුවේ විෂය පථයට ගැනෙන කාර්යයන්හි වෘත්තීය හා කළමනාකරණ දැනුම.

05 තනතුරට බඳවා ගැනීමේ ක්‍රමය

(අ) පත්කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

(ආ) පහත 06 වන ඡේදයේ දැක්වෙන පරිදි සීමිත තරග විභාගයෙන් 40% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා අපේක්ෂකයින්, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් කුසලතා අනුපිළිවලින් බඳවා ගැනීමෙන් මෙම පුරප්පාඩු පුරවනු ඇත.

(ඇ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ, පහත 10 වන ඡේදයේ සඳහන් ලකුණු පරිපාටියට අනුව එකී කොමිෂන් සභාව විසින් පත්

කරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වනු ඇත.

(ඉ) පුරප්පාඩුවලින් 50% ක් සුරාබදු පරීක්ෂක තනතුරේ වසර 10 කට වැඩි සතුටුදායක සේවයක් සහිත පරීක්ෂකවරුන් සීමිත තරඟ විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීමෙන් පිරවිය යුතුය.(විධිමත් නිල පරීක්ෂණවලදී විශේෂඥ සාක්ෂි දීම සඳහා පිළිගනු ලැබීමට වසර 7 නොඅඩු සේවයක් සපුරාතිබීම අත්‍යාවශ්‍යය).

06 ලිඛිත පරීක්ෂණයේ විස්තර

(I) සුරාබදු දෙපාර්තමේන්තුවේ විෂය පථය යටතට ගැනෙන කාර්යයන් හා අදාළ විෂය පිළිබඳ දැනුම ( ලකුණු 100යි - කාලය පැය 02යි )

(II) රාජ්‍ය සේවයේ / විධායක කළමනාකරණ තනතුරක් දැරීමට සුදුසු දැනුම මැන බැලීම සඳහා වූ සාමාන්‍ය දැනුම ( ලකුණු 100යි - කාලය පැය 02යි )

(III) විභාගය කොළඹ නගරය තුළදී පැවැත්වේ

(IV) විභාගය සිංහල හා දෙමළ මාධ්‍ය වලින් පමණක් පැවැත්වේ.

(V) ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 09 තෙක් පළමුවන පිටුවටද ඉතිරිය 2/3 වන පිටුවලටද වන ලෙස ගෙන සකස් කල යුතු බවත් ඊට අදාල තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. ඉල්ලුම්පත්‍රයේ ජායාපිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වන අතර, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(VI) ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද , දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීමට අවශ්‍යයවේ.

(VII) අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කල වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය

නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ සහතික කළ ජයා පිටපත්ද , ලියාපදිංචි කල කුවිතාන්සියද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකය සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියේ පිටපතක් ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(VIII) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන විභාග වලදී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරුකිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචිකිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණකි.

(IX) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(X) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවේ.

07 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

(I) දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට නියම කරනු ලැබිය හැකිය.

(II) වැඩ බලන කාලසීමාව තුළදී හෝ දීර්ඝ කරනු ලැබූ වැඩ බලන කාලසීමාව තුළදී හෝ තනතුරේ ස්ථිර කිරීමට සුදුසු නොමැත්තකු වේනම්, ඔහු කලින් දැරූ තනතුරට ආපසු යවනු ලැබේ

(III) සුරාබදු අධිකාරී තනතුරට පත්කිරීමට තෝරා ගනු ලබන අය, එක් අවුරුදු වැඩ බලන කාලසීමාවකට යටත් කොට පත් කරනු ලැබේ. වැඩ බලන කාලය අවසානයේදී තනතුර ස්ථිර කරනු ලැබුවහොත් ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධාන පරිදි සුරාබදු අධිකාරී තනතුරට හිමි වැටුප් ක්‍රමයේ නිසි වැටුප් තලයේ තබනු ලැබේ.

(IV) මෙම පත්වීම ක්‍රියාත්මක වන දිනය, සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අවසන් දිනය වනු ඇත.

08 කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය

සුරාබදු අධිකාරී තනතුරේ ස්ථිර කිරීමට පෙර දෙපාර්තමේන්තු නියෝග යටතේ වූ "එච්" පරීක්‍ෂණය සමත් විය යුතුය. මෙම පරීක්‍ෂණය සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 50 ක් ලබාගත යුතුය.

09 සේවා කොන්දේසි

(I) 1956 අංක 33 දරණ භාෂා පනතේ විධි විධාන හා ඊට පසුව පනවන ලද හා පනවනු ලබන විධිවිධාන ක්‍රියාත්මක කිරීමට බැඳී සිටිය යුතුය.

(II) ආයතන සංග්‍රහයේ (II)වන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාළ වේ.

(III) අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

(IV) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධි විධානද අදාළවේ.

10. ලකුණු පරිපාටිය

1. ජ්‍යෙෂ්ඨතාවය — <u>ලකුණු 35යි</u>

(පරීක්ෂක තනතුරක දස අවුරුද්දක් ඉකුත්වීමෙන් පසු පරීක්ෂක ශ්‍රේණියේ එක් වසරකට ලකුණු 2 බැගින් හා ප්‍රධාන පරීක්ෂක තනතුරේ වසරකට ලකුණු 5 බැගින් සතුටුදායක සේවා කාලය සඳහා )

2.කාර්යසාධන ඇගයීම — <u>ලකුණු 20යි</u>

(පසුගිය වසර 05 සඳහා )

| | |
|---|---|
| විශිෂ්ඨ | ලකුණු 04 යි |
| සාමාන්‍ය ප්‍රමාණයට වඩා වැඩි | ලකුණු 03 යි |
| සතුටුදායක | ලකුණු 02 යි |

3.සාධු සටහන් / ප්‍රශංසා සඳහා **ලකුණු 20යි**

( පසුගිය වසර 05 සඳහා ලබා ඇති )

විශේෂ සාධු සටහන් (එකකට) ලකුණු 04 යි

සාධු සටහන් ( සාමාන්‍ය ) ලකුණු 03 යි

4. උසස් අධ්‍යාපන සුදුසුකම් **ලකුණු 10යි**

( පහත විෂයන්ට අදාලව )

a. උපාධිය ලකුණු 05යි

b. පශ්චාත් උපාධි සඳහා ලකුණු 10යි

c. පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා ලකුණු 03 යි

(I) කළමනාකරණය (II) සැලසුම්කරණය

(III) අපරාධ විද්‍යාව (IV) නීතිය

(අ) සුරාබදු පරීක්ෂක තනතුරට බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් ලෙස විශ්ව විද්‍යාල උපාධිය සලකනු ලබන බැවින්, පශ්චාත් උපාධි සුදුසුකම් පමණක් මෙහිදී සැලකිල්ලට ගනු ලැබේ. නමුත් උපාධි සුදුසුකම් සහිතව සුරාබදු පරීක්ෂක තනතුරට පැමිණ ඉන් අනතුරුව සේවාවට අදාළව උපාධියක් ලබා ඇත්නම් ඒ සඳහා ඉහත පරිදි ලකුණු ලබා දෙනු ඇත.

(ආ) උසස් අධ්‍යාපන සුදුසුකම් යටතේ උපාධිය සඳහා ලකුණු ලබා දීමේ මූලික සුදුසුකම් යටතට නොගැනෙන ඉහතින් දක්වා ඇති අනිකුත් විෂයන්ට අදාළ උපාධි සලකා බලනු ඇත.

5.අදාළ ක්ෂේත්‍රයේ පුහුණු වීම් ලකුණු 05 යි

- වසරකට වඩා වැඩි ලකුණු 05යි
  ( පුහුණු කාලය පැය 180 කට වැඩි )
- මාස 06 සිට එක් වසරක් දක්වා ලකුණු 03යි
  ( පුහුණු කාලය පැය 60 කට වැඩි )
- මාස 03 සිට මාස 06 දක්වා ලකුණු 02යි
- මාස 01 සිට මාස 03 දක්වා ලකුණු 01යි

6. සම්මුඛ පරීක්ෂණය ලකුණු 10 යි

(මේ යටතේ විශේෂ හැකියාවන්, නායකත්ව

ගුණාංග හා වෙනත් කුසලතා සැලකිල්ලට

ගනු ලැබේ)

**<u>මුළු ලකුණු</u>** 100 යි

රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි ද, තනතුරට අදාළ වන්නාවූ සුරාබදු දෙපාර්තමේන්තුවේ වෙනත් කොන්දේසි හා රෙගුලාසි ද අදාළ වේ. මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

දිනය : 20.06.2012